**උක් පර්යේෂණ ආයතනය - 2017**

**-------------------------------------**

උක් පර්යේෂණ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 19 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයෙහි 48 ඡේදය අනුව වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් හා වගකීම් ගිණුම් 11 ක පැවති රු.26,634 ක් හා රු.3,856,184 ක් වන සෘණ ශේෂ හිලව්කරමින් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ ලෙස පිළිවෙලින් රු.44,387,389 ක් හා රු.20,686,978 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව භාණ්ඩාගාර බිල්පත් උපලබ්ධි වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට බැංකුව විසින් එවන ලද ශේෂ සනාථන අනුව භාණ්ඩාගාර බිල්පත් උපලබ්ධි වටිනාකම රු.92,024,500 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.89,122,043 ක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ ණය පදනම මත ලබාගෙන තිබුණු රු.15,205,107 ක් වටිනා ලයිසිමීටර් පද්ධතිය, ඩේටා ලොගර්, වායු සමීකරණ යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර ආදී වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණද අදාල වත්කම් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විගණනයේ ගණනය කිරීම්වලට අනුව භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු. 10,305,506 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනවල රු. 9,297,943 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු. 1,007,563 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගිණුම්ගත කිරීමේ දෝෂයක් හේතුවෙන් 2012 වර්ෂයේ සිට රු.250,000 ක මුදලක් කෙරීගෙන යන වැඩ ගිණුමේ පෙන්වා ඇතත් ඊට අදාල වූ නිවැරදි ගිණුම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදි ආරක්ෂිත තැන්පතු ලෙස ගෙවූ රු. 90,000 ක මුදල වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ආයතනය සතුව ඇති අක්කර 03 පර්චස් 35 ක භූමියේ වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

සෙවනගල සීනි කර්මාන්ත ආයතනයෙන් උක් දඩු සඳහා ලැබිය යුතු රු. 1,063,131ක් ද 2014 වර්ෂයේ දී ලංකා සීනි සමාගමට සපයන ලද උක් පැණි සඳහා ලැබිය යුතු රු. 86,780 ක්ද කන්තලේ සීනි සමාගමෙන් ලැබිය යුතු රු.1,000,000ක් ද වසර 5කට අධික කාලයක් ගතවී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 79,402,411 ක ඌණතාවයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 88,198,790 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 167,601,201 ක පිරිහීමක් විය. රජයේ ප්‍රදාන රු.80,170,000 කින් අඩුවීම හා විදේශ ගමන් වියදම් රු. 6,834,091 කින් වැඩිවීම හා ගිවිසුම් ගත සේවා රු. 23,996,310කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.28,730,918ක ඌණතාවයක් පැවතුණි. නමුත් 2014 වර්ෂයේ වූ රු.6,780,836ක අතිරික්තය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු. 79,402,411 ක ඌනතාවයක් බවට පත් වී තිබුණි. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.96,000,245 වූ දායකත්වය අඛණ්ඩව වැඩි වී 2016 වර්ෂයේදී රු.312,417,371 ක් වී තිබුණද 2017 වර්ෂයේදී රු.155,645,764 දක්වා පිරිහී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

ආයතනයේ සේවයෙන් ඉවත් කර ඇති පුද්ගලයකු විසින් ආයතනයට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුදුසු උක් ප්‍රභේද හඳුන්වාදීම, රෝග පාලනය, උක්වගා ක්‍රමවේද හා සීනි උකහා ගැනීම් ප්‍රතිශතය වැඩි කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද ගොවි මහතුන් අතර ප්‍රචලිත කිරීම උක් පර්යේෂණ ආයතනයේ ප්‍රධාන අරමුණ වුවත්, එම අරමුණ සාර්ථකව ඉටු නොවීම නිසා ආයතනය පිහිටුවා දැනට වසර 37 ක් පමණ ගත වී තිබුණ ද, ආයතනය විසින් දේශීය සීනි නිෂ්පාදිතය වැඩි කර ගැනීමට ලබාදී තිබූ දායකත්වය අඩුවී තිබුණි. 2013 වර්ෂයේ සිට මුළු සීනි අවශ්‍යතාවයෙන් දේශීය සීනි නිෂ්පාදනය සියයට 9 ක් පැවති අතර එය සමාලෝචිත වර්ෂයේද එලෙසම පැවතුනි.

(ආ) උක් අස්වැන්න නෙළීමේදී පවතින ශ්‍රම සැපයුමේ ඌනතාවයට පිළියමක් ලෙස ආයතනය විසින් නවීන තාක්ෂණය අනුව නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම සහ ඒවා භාවිතා කිරීම පිළිබඳ ගොවියන් දැනුවත් කර ගුණාත්මක උක් ඵලදාවක් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1986 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ උක් ප්‍රභේද 40 ක් හෙක්ටයාර 15,743ක භූමි ප්‍රදේශයක පර්යේෂණ සඳහා ව්‍යාප්ත කර තිබුණි. මෙයින් උක් ප්‍රභේද 23 ක් හඳුන්වා දී තිබූ අතර ඉන් උක් ප්‍රභේද 16 ක්ම වගාකර තිබුණේ හෙක්ටයාර් 304 ක් පමණ වූ කුඩා භූමි ප්‍රදේශයකය.

(ඈ) වර්තමානය වන විට උක් වගා කර ඇති භූමි ප්‍රමාණයෙන් සියයට 58 ක පමණ ප්‍රතිශතයක් ව්‍යාප්ත වී ඇත්තේ 2012 වර්ෂයේ හඳුන්වාදුන් SL 96128 නමැති උක් ප්‍රභේදය වන අතර මෑත කාලයේ හඳුන්වා දී ඇති උක් ප්‍රභේද සඳහා ගොවි මහතුන්ගේ පවතින ආකල්ප , රෝග සහ පළිබෝධ වලට ඔරොත්තු දීමේ හැකියාව අඩුවීම නිසා ඒවා ව්‍යාප්ත වීම අඩු මට්ටමක පැවතුණි.

(ඉ) රෝග හා පළිබෝධ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩමුළු පවත්වා තිබුනද උක් වගාවේ පවතින සුදු පත්‍ර රෝගය සහ කළු දුඹුරු රෝගය මර්ධනය කිරීමට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 අංක 75 දරන උක් පර්යේෂණ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව දේශිය සිනී නිෂ්පාදන ආයතන විසින් නිෂ්පාදිත සීනි ප්‍රමාණය මත කිලෝග්‍රෑම් එකක් සඳහා ශත 10ක සෙස් බද්දක් ආයතනය විසින් අය කරනු ලබන අතර මෙම සෙස් බද්ද සමාලෝචිත වර්ෂය තුළ සෙවනගල හා ගල් ඔය සීනි කර්මාන්තායතනයෙන් අය කිරීමට කටයුතු නොකිරීම නිසා රු. 2,794,864 ක් අය වී නොතිබුණි.

(ආ) සේවයෙන් ඉවත්වීම හා මිය යාම හේතුවෙන් 2016 වර්ෂයේ සිට නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 264,988 ක ආපදා ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 1984 වර්ෂයේ සිට ආයතනයේ සේවකයන් සඳහා වෛද්‍යාධාර යොජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබූ අතර සාමාලොචිත වර්ෂයේදී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරිම වෙනුවෙන් රු. 7,755,875 ක වියදමක් දරා තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 193 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 177 ක් වීමෙන් තනතුරු 11 ක් සඳහා පුරප්පාඩු 16 ක් පැවතුණි.

(ආ) ප්‍රධාන පර්යේෂණ නිලධාරි, ප්‍රධාන තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි, ජ්‍යෙෂ්ඨ තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි, තාක්ෂණ නිලධාරී, ආදී තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම නිසා ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බධාවක් වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව උක් පර්යේෂණ ආයතනය විසින් නව විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත පරිදි 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව උක් පර්යේෂණ ආයතනය දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සංදිස්ථානයක්ද ඉලක්ක මත ලඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයක් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර ඉලක්ක කරා ලගා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීමට සහ එම කාර්යයන් ඉටුකිරීමට අවශ්‍යවන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත් ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලකක්යන්හි ලඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ආයතනය විසින් 2016 වර්ෂයට අදාල වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතනයේ පරිපාලන කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන කාර්ය සංවිධාන සංග්‍රහය අනුමත කර නොගැනීම. |
| (ආ) | ආදායම් රැස්කිරීම | නිවැරදි තොරතුරු ලබා ගෙන සෙස්බදු ආදායම ගණනය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ලැබිය යුතු ශේෂ | දීර්ඝකාලීනව අය නොවී පවතින ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු නොකිරීම. |